# වාරිමාර්ග දෙපාර්තමේන්තුව
## நீர்ப்பாசனத் திணைக்களம்
## IRRIGATION DEPARTMENT
### (HYDROLOGY DIVISION)

වාරිමාර්ග අධ්‍යක්ෂ / நீர்ப்பாசனத பணிப்பாளர் / Director of Irrigation: 011-2581636
ෆැක්ස් / பக்ஸ் / Fax: 011-2591125
ලිපිනය / முகவரி / Address: 230, තැ.පෙ. 1138, බෞද්ධාලෝක මාවත, කොළඹ07.
230, த.பெ.1138,பௌத்தாலோக்கமாவத்தை, கொழும்பு 07,இலங்கை
230, P.O. Box 1138, Bauddhaloka Mawatha, Colombo 07.
දුරකථනය (පොදු) / தொலைபேசி (பொது) / Telephone (General): 011-2590145
විද්‍යුත් ලිපිනය / ஈ.மெயில் முகவரி / E-mail Address: ddhydrology@gmail.com
වෙබ් අඩවිය / இணையதளம் / Web site: www.irrigation.gov.lk


මගේ අංකය / எனது இல / My No.: HYG/W/103
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திக / Date: 2021.05.17

**ගංවතුර අනතුරු ඇඟවීම් ඉවත් කිරීමේ නිවේදනය**

2021.05.17 වන දින ප.ව. 1.30ට නිකුත් කරන ලදී.

**<u>ගංවතුර අනතුරු ඇඟවීම ඉවත් කිරීම.</u>**

01. පසුගිය පැය 48 තුළ දිවයිනේ කිසිදු ප්‍රදේශයකින් සැලකිය යුතු වර්ෂාපතනයක් වාර්තා නොවීම නිසාත්, ඉදිරි දින සඳහා වූ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ කාලගුණ අනාවැකි මගින් සැලකිය යුතු මට්ටමේ ඉහළ වර්ෂාපතනයක් පිළිබඳ අනතුරු ඇඟවීමක් නොමැති නිසාත්, පසුගිය දිනවල දිවයිනේ නිරිත දිග ප්‍රදේශයේ ගංඟාවලින් වාර්තා වූ තරමක් ඉහල ජල මට්ටම් මේ වන විට සැලකිය යුතු ලෙස පහල යමින් පවතින නිසාත් එම ගංඟාවල ගංවතුර සම්බන්ධයෙන් වූ අවදානම් සහගත තත්ත්වය මේ වන විට පහව යමින් පවතී.

02. ඒ අනුව වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ අංශය මගින් නිකුත් කරන ලද පහත සඳහන් පූර්ව ගංවතුර අනතුරු ඇඟවීම් නිවේදන මගින් සිදු කරන ලද අනතුරු ඇඟවීම් මෙමගින් ඉවත් කරනු ලැබේ.
    i. 2021.05.13 දින ප.ව. 4.00 ට කළු ගංඟා ද්‍රෝණිය සඳහා නිකුත් කරන ලද නිවේදන - අංක 01
    ii. 2021.05.13 දින ප.ව. 4.00 ට ගිං ගංඟා ද්‍රෝණිය සඳහා නිකුත් කරන ලද නිවේදන - අංක 01
    iii. 2021.05.13 දින ප.ව. 5.00 ට නිල්වලා ගංඟා ද්‍රෝණිය සඳහා නිකුත් කරන ලද නිවේදන - අංක 01
    iv. 2021.05.13 දින ප.ව. 11.00 ට අත්තනගලු ඔය ද්‍රෝණිය සඳහා නිකුත් කරන ලද නිවේදන - අංක 01
    v. 2021.05.14 දින පෙ.ව. 1.30 ට මහ ඔය ද්‍රෝණිය සඳහා නිකුත් කරන ලද නිවේදන - අංක 01
    vi. 2021.05.13 දින පෙ.ව. 2.00 ට කැළණි ගංඟා ද්‍රෝණිය සඳහා නිකුත් කරන ලද නිවේදන - අංක 01

03. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුවේ ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ අංශය විසින් පවත්වාගෙන ආ ගංවතුර පුරෝකථන මැදිරියේ රාත්‍රී මෙහෙයුම් කටයුතු අද දින පස්වරු 3.30 සිට නතර කරන නමුත් දිවයිනේ සියළුම ගංඟාවල ජලමට්ටම් නිරීක්ෂණය මෙම අංශය විසින් සාමාන්‍ය පරිදි අඛණ්ඩව කරගෙන යනු ලැබේ. එළඹෙන තත්ත්වයන් පිළිබඳව වාරිමාර්ග දෙපාර්තමේන්තුව නිරන්තර විමසිල්ලෙන් පසුවන අතර, ගංඟාවල ජලමට්ටම් ඉහල යාම සම්බන්ධයෙන් සුදුසු පරිදි කල්වේලා ඇතිව දැනුම්වත් කිරීමට කටයුතු කරනු ලැබේ.

ඉංජි. එස්.පී.සී.සුගීෂ්වර

වාරිමාර්ග අධ්‍යක්ෂ (ජලවිද්‍යා හා ආපදා කළමනාකරණ)